# මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## ලංසු ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ
## වැලිසර හා මිරිහාන රැඳවුම් මධ්‍යස්ථාන රැඳවියන් සඳහා
## ආහාර පාන සැපයීම 2025/2026

## කොන්ත්‍රාත් අංකය - DIE/PRO/05/2024/74


**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

දුරකතන අංකය : 011 210 1559
ෆැක්ස් අංකය : 011 287 9091

CERTIFICATE OF ISSUING OF BID DOCUMENT
(TO BE FILLED BY THE ISSUING OFFICER AT THE ISSUING TIME)

Supply of food for the detainees at welisara and Mirihana Detention centers of the Department of Immigration and Emigration
Contract No : DIE/PRO/05/2024/74

01. Name of the Bidder : ……………………………………………………………

02. Contract No : DIE/PRO/05/2024/74

03.

a. Issued To : ……………………………………………………………

b. Address : ……………………………………………………………

c. Telephone No : ……………………………………………………………

d. Email address : ……………………………………………………………

04. Bid document Charges : **LKR Five Thousand Five Hundred Only**

05. Receipt No : ……………………………………………………………

06. Number of copy issued : 02 Copies (Original & Duplicate)

07. Authorized issuing Officer :

a. Name : W.M.C.S.K. Wijesundara

b. Designation : Deputy Controller (Procurement)

08. Issuing officer :

a. Signature : ……………………………………………………………

b. Name : ……………………………………………………………

c. Designation : ……………………………………………………………

09. Date of Issue :

10. Place of Issue : procurement Division

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**<u>ලංසු ආරාධනය</u>**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර හා මිරිහාන විදේශික රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීම 2025/2026

**කොන්ත්‍රාත් අංකය: DIE/PRO/05/2024/74**

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වැලිසර හා මිරිහාන විදේශික රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීම වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර 2025.09.08 දින සිට 2025.09.26 දින දක්වා ඕනෑම රාජකාරී දිනයකදී පෙ.ව. 9.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරු පාය" **05 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන)** වෙතින් ලබාගත හැකි අතර එම ලිපිනයේදීම ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාව සිදු කළ හැක.
ඇමතුම් අංක : දුරකථන 011 210 1559

04. ආපසු ගෙවනු නොලබන රුපියල් පන්දහස් පන්සීයක (රු. 5,500.00) ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), 05 වෙනි මහල බී පර්යන්තය ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2025.09.08** දින සිට **2025.09.26** දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ලබා ගත හැකිය. ගෙවීම් ක්‍රමය මුදලිනි.

05. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් 2කින් යුතුව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, 5 වන මහල, "බී" පර්යන්තය, ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට **2025.09.29** වැනි දින **පෙ.ව. 10.30** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේදී පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර එම ලංසු විවෘත නොකර ආපසු භාරදීම සිදු කරනු ලැබේ.

06. ලංසුකරු විසින් භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින 91 (2025.12.08) කාල සීමාවකට හෝ ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

07. සියලුම ලංසු, ලංසු ලේඛනයේ 3.3හි දක්වා ඇති ආකෘතියේ පරිදි ලංසු සුරක්ෂණයක් සමඟ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත (ලිපිනයට) එවිය යුතු අතර ලංසු සුරක්ෂණය රු.500,000.00 ක වටිනාකමකින් යුතු **2026.01.05** දින තෙක් වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම **2025.09.15** වැනි දින පෙ.ව. **10.00** ට "සුහුරුපායෙහි" 5 වන මහලෙහි පිහිටි ආගමන හා විගමන පාලක ජනරාල් කාර්යාලයේ දී පැවැත්වේ.

**අයි. චමින්ද පතිරාජ**
**පාලක ජනරාල් (වැ/බ)**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

# පටුන


පිටු අංකය

1. <u>කොටස</u>

1.1 2025 / 2026 වර්ෂය වෙනුවෙන් වැලිසර හා මිරිහාන රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීමේ ප්‍රසම්පාදන කොන්දේසි 4 - 6

1.2 වැලිසර හා මිරිහාන රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීමේ උපලේඛනය 7

2. <u>කොටස</u>

2.1 ලංසු ආකෘති පත්‍රය 8

3. <u>කොටස</u>

3.1 පිරිවැය වාර්තාව 9

3.2 ලංසු අයදුම්කරුගේ ප්‍රකාශය 10 - 11

3.3 ලංසු සුරක්ෂණ සහතිකය සඳහා ආකෘති පත්‍රය 12 - 13

4. <u>කොටස</u>

4.1 කොන්ත්‍රාත් ගිවිසුම 14 - 18

4.2 කාර්ය සාධන සුරක්ෂණය සඳහා පිළිගත් ආකෘතිය 19

4.3 දිවුරුම් ප්‍රකාශය 20

## 1 කොටස

### 1.1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර විදේශික රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතු පිණිස සාමාන්‍ය කොන්දේසි

01. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන සැපයුම්කරුවන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආදායම් පනත හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි අයවලුන් විය යුතු අතර, ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

02. ප්‍රසම්පාදන කාර්යය සාමාන්‍යයෙන් එක් වසරකට පමණක් සීමා වේ. ආහාර සැපයීමේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක සේවය නතර කිරීමට ආගමන විගමන පාලක ජනරාල්ට බලය ඇති අතර කිසියම් හේතුවක් නිසා කොන්ත්‍රාත්කරුට අවශ්‍ය නම් දෙපාර්තමේන්තුවට මාස තුනකට පෙර දැන්වීමකින් පසු කොන්ත්‍රාත්තුව අවසන් කළ හැක.
,

03. ආහාර සැපයීම දිනපතා පහත දක්වා ඇති වේලාවන්ට පෙර සිදුකල යුතුය. නියමිත වේලාවට ලබා නොදුනහොත් එම ආහාරවේල සඳහා ගෙවීම් සිදු නොකෙරේ. තවද, සියළු ආහාර රැඳවියන්ට ලබා දීමට පෙර එහි නියැදියක් වැලිසර හා මිරිහාන කඳවුරේ රාජකාරියෙහි නියුතු බලයලත් නිලධාරියෙකු මගින් පරීක්ෂා කරගත යුතුයි.

| | | |
|---|---|---|
| උදෑසන ආහාර වේල - | | පෙ.ව. 7.00 |
| දහවල් ආහාර වේල | - | මධ්‍යාහ්න 12.00 |
| රාත්‍රී ආහාර වේල | - | ප.ව. 6.00 |

04. ආහාර සැපයීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ප්‍රවාහන පහසුකම් සපයා ගතයුතු අතර, මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රවාහන පහසුකම් සපයා දෙනු නොලැබේ. ආහාර පාන ප්‍රවාහනය කිරීමේදී සෞඛ්‍යාරක්ෂිතව සිදුකළ යුතුය. එහිදී ආහාරයට නුසුදුසු තත්ත්වයට පත් වූ ආහාර සඳහා ගෙවීම් සිදු නොකෙරේ.

05. අවස්ථානුකූලව රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය.

06. ආහාර සැපයීම සතියේ දින 05, සතිඅන්ත, පෝය දින හා වෙනත් නිවාඩු දින ඇතුළුව සෑම දිනකම සිදුකළ යුතුය.

07. දිනපතා සැපයිය යුතු ආහාර ද්‍රව්‍ය පිළිබඳ විස්තරය 1.2 උපලේඛනයෙහි සඳහන් පරිදි විය යුතුය.

08. දිනපතා සැපයිය යුතු ආහාර ප්‍රමාණය රඳවා සිටින රැඳවියන් ප්‍රමාණය අනුව වෙනස්වන අතර, පසුගිය වසරවල දත්ත අනුව සාමාන්‍යයෙන් දිනකට රැඳවියන් 120 ක් පමණ රැඳී සිටී.පෙරදින ප.ව 4.00 ට රැඳවුම් කඳවුර විසින් ඉදිරි දිනයේදි සැපයිය යුතු ආහාර ප්‍රමාණය දන්වනු ලැබේ. කෙසේ වෙතත් වැඩිපුර ආහාර ප්‍රමාණයක් අවශ්‍ය වූ විට ප.ව 4.00 න් පසු වුව ද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙකුගේ දැනුම් දීමකින් ලබා දෙන ආහාර ප්‍රමාණය වැඩි කිරීමට හැකිවිය යුතුය.

09. උපලේඛනයේ සඳහන් ආහාර ද්‍රව්‍යවලට අමතරව වෙනත් ආහාර අවශ්‍ය වූ විටෙකදී ඒවා සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. දී ඇති ලැයිස්තුවට වෙනස් වූ ආහාර දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව ලබාදිය නොහැක.

10. තේ සඳහා Tea Bags පමණක් පාවිච්චියට ගත යුතු අතර, කිරි තේ සඳහා පාවිච්චි කළ යුත්තේ එළකිරි හෝ පිටිකිරි පමණි.

11. යම් ආහාර වේලක් ආහාරයට නුසුදුසු බව රාජකාරියේ නියුතු බලයලත් නිලධාරියා තීරණය කළහොත්, වෙනත් ආහාර වහාම සැපයිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් මෙම ගිවිසුමේ පහත 12 අනුව කටයුතු කරනු ලැබේ.

12. ඔබ විසින් ගිවිසුම් ප්‍රකාරව සඳහන්කර ඇති ආහාර සැපයීමට අපොහොසත් වීම මත විවෘත වෙළඳපොලෙන් මිළදී ගැනීමට සිදුවන ආහර වේල් සඳහා වැය වන මුදල සහ එම මුදලෙන් 5% ක අමතර ගාස්තුව ඔබගේ බිල්පතෙන් අඩු කිරීමට ආගමන විගමන පාලක ජනරාල් වෙත බලය ඇත.

13. වැලිසර / මිරිහාන රැඳවුම් මධ්‍යස්ථාන වලට අයත් පළාත් පාලන ආයතනයේ නීතිරීති හා නියෝග වලට අනුකූල වන පරිදි ආහාරපාන පවිත්‍රව පිළියෙල කොට සැපයීම සඳහා කොන්ත්‍රාත් කරු විසින් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

14. උපලේඛනයේ සඳහන් ආහාරපාන එකඟ වූ මිල ගණන් අනුව සැපයීම කළයුතු අතර, එම මිලගණන්වල වෙනසක් කළ හැක්කේ දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්වය. සපයනු ලබන ආහාරපාන දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රමිතියට අනුව තිබිය යුතුය.

15. ඔබ විසින් ආහාර පිළියෙල කරනු ලබන ස්ථානය අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂා කිරීම සඳහා අදාල සෞඛ්‍ය අංශ වලට හා ආගමන හා විගමන පාලක ජනරාල් විසින් බලය පැවරූ නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය.

16. කොන්ත්‍රාත්තුව භාර ගැනීමට පෙර තෝරාගත් ලංසුකරු විසින් රු. 1,000,000.00 ක වටිනාකමින් යුත් මුදලක් සඳහා කාර්ය සාධන බැඳුම්කරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවකින් ලබාගෙන ඉදිරිපත් බල යුතුය.

17. කෙටි දැනුම් දීමකින් පසුව වුවද, තෝරා ගත් කොන්ත්‍රාත්කරු දෙපාර්තමේන්තුව නියම කරනු ලබන දිනයේ සිට ආහාර සැපයීමට සූදානම්ව සිටිය යුතුය.

**18. ලංසු ලියවිලි සමග 2003 අංක 09 දරණ පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් නිකුත් කරන ආහාරපාන පිළියෙල කරන, සපයන ආයතනය සඳහා යහපත් නිමැවුම් පරිචයන් පිළිබඳ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. (GMP)**

**19. ලංසු ලියවිලි සමඟ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙතින් ලබාගත් තත්ත්ව සහතිකයක් අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතුය.**

**20. ලංසු ලියවිලි සමඟ ප්‍රාදේශිය සභාවෙන් ලබාගත් වෙළඳ බලපත්‍රයක් අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතුය.;**

**21. ලංසු ලියවිලි සමඟ ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.**

22. **ලංසු ලියවිලි සමඟ දැනට (2025 වර්ෂයේ) සේවය සපයනු ලබන ආයතන හා ලිපිනයන් පිළිබඳ විස්තර ද ඉදිරිපත් කළ යුතුය**.

23. නරක් වූ හෝ කල් ඉකුත් වූ හෝ ආහාරයට නුසුදුසු ආහාර පාන සැපයිය නොහැකි අතර, එවන් අවස්ථාවකදී එම ආහාර වේල සඳහා ගෙවීමක් සිදු නොකෙරේ. තවද මෙය ප්‍රසම්පාදන කොන්දේසි කඩකිරීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

24. මෙම දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹෙන කොන්ත්‍රාත්කරු කිසිදු අවස්ථාවක තැනැත්තන් වෙළඳාම හෝ එවැනි මිනිස් ජාවාරමක් හා සම්බන්ධ කරුණකට අධිකරණයෙන් වරදකරුවකු වූවෙක් නොවිය යුතුය.

25. බිල්පත් ඉදිරිපත් කිරීමේදී පෙර මස බිල්පත ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

26. රජය විසින් ආහාර සැපයීම සම්බන්ධයෙන් මේ දක්වා නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය.

- ඉහත සියළු කොන්දේසි සඳහා එකඟ වෙමි / නොවෙමි. .........................................
- පහත සඳහන් කොන්දේසි හැර අනෙකුත් කොන්දේසි සඳහා එකඟවෙමි.
  ..................................................................................................................................
  ..................................................................................................................................
  ..................................................................................................................................
  ..................................................................................................................................
  ..................................................................................................................................
  ..................................................................................................................................

ලංසුකරුගේ අත්සන - .............................................

ලංසුකරුගේ නම - .............................................

(රබර් මුද්‍රාව)

දිනය - ..................................................

1.2. **වැලිසර හා මිරිහාන විදේශික රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීමේ උපලේඛනය**

| ආහාර වේල | එක් පුද්ගලයෙකුට ආහාර වට්ටෝරුව |
|---|---|
| උදෑසන | • පාන් බාග 1 / ඉදිආප්ප 20<br>• පරිප්පු / අල සමඟ හොදි (පිසූ පසු 80g -100g)<br>• පොල් සම්බෝල (50g)<br>• කිරි තේ 01 |
| දහවල් | • සුදු බත් (250g – 275g)<br>• එළවළු වර්ග 02 (පිසූ පසු 80g -100g - එක් එළවළුවක්)<br>• (පරිප්පු / අල / වෙනත්) හොදි (පිසූ පසු 80g -100g)<br>• මාළු / කුකුල් මස් / බිත්තර (පිසූ පසු 80g -100g)<br>• කෙසෙල් ගෙඩියක් |
| රාත්‍රී | • ඉදිආප්ප 20 / නූඩ්ල්ස් / ලොකු පරාටා 02<br>• බිත්තර / මාළු / කුකුල් මස් සමඟ ප්‍රමාණවත් හොදි (පිසූ පසු 80g -100g)<br>• පොල් සම්බෝල (50g) |

## 2 කොටස

### 2.1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර විදේශික රඳවුම් කඳවුරුවල රඳවියන් හට ආහාර සැපයීම සඳහා ලංසු කැඳවීම

01. සම්පූර්ණ නම : ..............................................................................................................
.......................................................................................................................................

02. ස්ථිර ලිපිනය : ..............................................................................................................
.......................................................................................................................................

03. ව්‍යාපාර ලිපිනය : ..........................................................................................................
.......................................................................................................................................

04. ව්‍යාපාර නාම ලියාපදිංචි අංකය : ...................................................................................
(සහතිකයේ පිටපතක් ඇමුණන්න.)

05. දුරකථන අංකය : ..........................................................................................................
.......................................................................................................................................

06. දැනට සේවය සපයනු ලබන ආයතන හා ලිපිනයන් පිළිබඳ විස්තර : (සනාථ කිරීමේ ලිපි අමුණන්න)
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

07. හෝටල් සහ ආපන ශාලා පවත්වාගෙන යාමේ පළපුරුද්ද :
(අවශ්‍ය සහතිකවල මුල් පිටපත් අවශ්‍ය විටෙකදී ඉදිරිපත් කළ යුතුයි.)
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

07. එක් පුද්ගලයෙකු සඳහා ආහාර වේල් 03 වෙනුවෙන් දිනකට අය කරනු ලබන මුළු මුදල
(3.1 පිරිවැය වාර්තාවේ සවිස්තරව දැක්විය යුතුය.) ...............................................................

ඉහත සඳහන් කරුණු සහ තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, ආහාර සැපයීම සඳහා මා තෝරා පත්කර ගතහොත් මෙහි අමුණා ඇති කොන්දේසි පත්‍රයේ සඳහන් කරුණු වලට යටත්ව අමුණා ඇති ලේඛනයේ සඳහන් මිලගණන්වලට අනුව ආහාරපාන සපයන බවටත් සහතික කරමි.

ලංසුකරුගේ අත්සන : ................................................ දිනය : ................................

ලංසුකරුගේ නම : ....................................................................

(රබර් මුද්‍රාව)

## 3 කොටස

### 3.1. පිරිවැය වාර්තාව

| ආහාර වේල | එක් පුද්ගලයෙකුට ආහාර වට්ටෝරුව | එක් පුද්ගලයෙකු සඳහා අය කරන මුදල (රු.) |
|---|---|---|
| උදෑසන | • පාන් බාග 1 / ඉදිආප්ප 20<br>• පරිප්පු / අල සමඟ හොදි (පිසූ පසු 80g -100g)<br>• පොල් සම්බෝල (50g)<br>• කිරි තේ 01 | --------------- |
| දහවල් | • සුදු බත් (250g – 275g)<br>• එළවළු වර්ග 02 (පිසූ පසු 80g -100g - එක් එළවළුවක්)<br>• (පරිප්පු / අල / වෙනත්) හොදි (පිසූ පසු 80g -100g)<br>• මාළු / කුකුල් මස් / බිත්තර (පිසූ පසු 80g -100g)<br>• කෙසෙල් ගෙඩියක් | --------------- |
| රාත්‍රී | • ඉදිආප්ප 20 / නූඩ්ල්ස් / ලොකු පරාටා 02<br>• බිත්තර / මාළු / කුකුල් මස් සමඟ ප්‍රමාණවත් හොදි (පිසූ පසු 80g -100g)<br>• පොල් සම්බෝල (50g) | --------------- |
| එක් පුද්ගලයෙකු සඳහා ආහාර වේල් 03 වෙනුවෙන් දිනකට අය කරනු ලබන මුළු මුදල | | -------------- |

ලංසුකරුගේ අත්සන : .................................................. දිනය : ................................

ලංසුකරුගේ නම : ..........................................................................

(රබර් මුද්‍රාව)

## 3.2. ලංසුවට අදාල කොන්දේසි හා උපදෙස් අනුගමනය කරන බවට වන ලංසු අයදුම්කරුගේ ප්‍රකාශය (ලංසුකරු විසින් ලංසු අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර හා මිරිහාන විදේශික රැඳවුම් කඳවුරුවල රැඳවියන් හට ආහාර සැපයීම සඳහා සේවා ආයතනය වෙනුවෙන් ලංසු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන මම, මෙම ආහාර සැපයීමට අදාළ ලංසු අයදුම්පතේ සඳහන් සියළු උපදෙස් හා කොන්දේසිවලට අතිරේකව මෙහි පහත දැක්වෙන සියළු කරුණුවලට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට එකඟ වන බව හා බැඳී සිටින බව මෙයින් ප්‍රකාශ කරමි. එයට අනුකූලව ද ආහාර සැපයීමට එකඟ වෙමි. ඊට අනුකූල නොවන අයුරින් කටයුතු කිරීම හෝ යටත් කිරීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව දනිමි.

1. ලංසු ඉදිරිපත් කරනු ලබන්නේ පෞද්ගලික සමාගමක් වන අවස්ථාවක එම සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සහ කොටස් හිමිකරුවන්ගේ නම් හා පෞද්ගලික ලිපිනයන් ආගමන විගමන පාලක ජනරාල් වෙත දැන්විය යුතු බව,

2. සේවයේ අවශ්‍යතාව මත දිනපතා ආහාර සැපයිය යුතු බව,

3. එම කොන්ත්‍රාත්තුව යටතේ ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුට මොනයම් හේතුවක් නිසා හෝ නොහැකි වුවහොත් වෙනත් ආයතනයකින් එම සේවාව ඉටු කරවා ගැනීමට, විධිවිධාන යෙදීමෙන් ආණ්ඩුවට දරන්නට සිදුවන්නා වූ යම් අතිරේක වියදමක් වේ නම් එම මුදල හා එම මුදලෙන් 5% අමතර ගාස්තුව ආහාර සැපයීමේ ආයතනයෙන් අයකර ගැනීමට ද ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇති බව,

4. ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ ආණ්ඩුවට ගෙවිය යුතු සියළුම මුදල්, ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරුට ගෙවන්නට තිබෙන ආහාර සැපයීමේ ගාස්තු මාසික බිල්පතෙන් අඩුකර ගැනීමට ආගමන විගමන පාලක ජනරාල් වෙත නීති ප්‍රකාරව බලය ඇති බව,

5. කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ තම අයිතිවාසිකම් වෙන කිසිම කෙනෙකුට පැවරීම හෝ අතුරු බද්දක් වශයෙන් දීම හෝ නොකළ යුතු බව, ආහාර සැපයීමේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක සේවය නතර කිරීම, නැවත ලංසු කැඳවීම හෝ වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ආගමන විගමන පාලක ජනරාල්ට බලය ඇති බව හා ආහාර සැපයීම් කොන්ත්‍රාත්කරු විසින් තම සේවය ඉල්ලා අස්කර ගන්නේ නම් මාස තුනක කාලයකට ප්‍රථම ඒ බව ආයතන ප්‍රධානියා මඟින් ආගමන විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතු බව,

6. ආහාර සැපයීමේ යොදවන අයගේ නම්, ලිපිනයන් සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඔවුන් සේවයේ යෙදවීමට පෙර ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් විසින් නම් කළ නිලධාරියෙකු වෙත භාරදිය යුතු බව,

7. ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස ආහාර සැපයීමේ ආයතනය නමින් තෝරා ගන්නා ස්ථානය වන....................................................................... ........................................................................................ (ආයතනයේ නම හා ලිපිනය) යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් දන්වා යැවුවහොත් ඒවා ඔහුට විධිමත් වූ පරිදි භාරදුන්නා සේ සලකන බව. ආහාර සැපයීමේ ආයතනයේ ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැන්විය යුතු බව, (කොන්ත්‍රාත් කාල සීමාව තුළ කොන්ත්‍රාත් ආයතනයේ නම වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.)

8. ආයතනය මඟින් ආහාර සැපයීම සඳහා යොදවන සේවකයින් රැඳවියන්ට මෙන්ම කාර්ය මණ්ඩලයටද ආචාරශීලීව හා විනය ගරුකව කටයුතු කළ යුතු බව හා රැඳවියන් සමඟ අයතා ගනුදෙනු කිසිසේත්ම නොපැවැත්විය යුතු බව,

9. ආහාර සැපයීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට ආහාර සැපයීම් ආයතනය විසින් ඒ බව ලිඛිත හෝ වාචිකව ආගමන හා විගමන පාලක ජනරාල් වෙත හෝ බලය පවරා ඇති නිලධාරියෙකුට දැන්විය යුතු බව.

10. ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද ලංසු ලේඛනයේ සඳහන් සියළුම කරුණු මෙම ගිවිසුමේ අවශ්‍යතාවය සඳහාද කොන්ත්‍රාත් කොන්දේසි ලෙස සලකනු ඇති බව.

11. කෙසේ වෙතත් එකී ලංසු ලේඛනයේ සඳහන් යම් වගන්තියක් මෙම ගිවිසුමේ අනිකුත් යම් වගන්ති හෝ වගන්තියක් සමඟ ගැටෙන්නේ නම්, එකී වගන්තිවලින් බලාත්මක වගන්තිය කුමක් ද යන්න තීරණය කිරීමේ බලය ආගමන හා විගමන පාලක ජනරාල් සතු බව.

12. ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු වෙනත් රෙගුලාසි ආගමන හා විගමන පාලක ජනරාල් විසින් වරින්වර නිකුත් කිරීමේ දී ඒවාට එකඟ වන බව.

ඉහත උපදෙස් හා කොන්දේසිවලට එකඟ වන බවට වර්ෂ ..................... මාස ...................ක් වූ දින .................................... අත්සන් තබමි.

...............................................................
ලංසුකරුගේ අත්සන
(රබර් මුද්‍රාව)

.........................................................................
(ලංසුකරුගේ නම)

සාක්ෂි:

1. අත්සන :
   නම :
   ජාතික හැඳුනුම්පත් අංකය :
   ලිපිනය :

2. අත්සන :
   නම :
   ජාතික හැඳුනුම්පත් අංකය :
   ලිපිනය :

**3.3 ලංසු සුරක්ෂණ සහතිකය සඳහා ආකෘතිය**

මෙම බැංකු සුරක්ෂණ සහතිකය වරහන් තුළ දැක්වෙන උපදෙස්වලට අනුකූලව පුරවන්න.

....................................... නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම සහ නිකුත් කරන ශාඛාවේ/ කාර්යාලයේ ලිපිනය

ප්‍රතිලාභියා: ......................................................................................... (ප්‍රසම්පාදන අස්තිත්වය විසින් දී ඇති) සේවායා / ගැනුම්කරුගේ නම සහ ලිපිනය

දිනය: ................................ (නිකුත් කරන නියෝජ්‍යායතනය දුන් දිනය)

ලංසු සුරක්ෂණ සහතිකයේ අංක: ...................................... (නිකුත් කරන නියෝජ්‍යායතනය දුන් අංකය) මෙහි මින් මතුවට ලංසුකරු වශයෙන් හඳුන්වනු ලබන ...................................................... ........................................................................................ විසින්
(නිකුත් කිරීමේ නියෝජ්‍යත්වය විසින් ලංසුකරු / බද්ධ ව්‍යාපාරයක් නම් සියලු නිත්‍යානුකූල හවුල්කරුවන්ගේ නාම ලේඛනයක්)

(මෙහි මින් මතුවට ලංසුකරු වශයෙන් හඳුන්වනු ලබන) .......................................... දින දරණ ලංසු සඳහා ආරාධනය අංක ..............................................................(අංකය ඇතුලත් කරන්න) යනුවෙන් ක්‍රියාත්මක කිරීම/සැපයීම සඳහා වන ........................................................... නැමැති කොන්ත්‍රාත්තුවට අදාල ලංසුව ඔබ වෙත ඉදිරිපත් කර ඇති (කොන්ත්‍රාත්තුවේ නම)
බව අප වෙත දැනුම් දී ඇත. තව ද, ඔබ විසින් පනවා ඇති කොන්දේසිවලට අනුව ලංසු සුරක්ෂණයක් සෑම ලංසුවක් සඳහාම තිබිය යුතු බව අපි දනිමු.

ලංසුකරුගේ ඉල්ලීම පරිදි, අපි .........................................................ලංසුකරු විසින් පහත සඳහන් (නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම) කොන්දේසි පැහැර හැරීම් හේතු කොට ගෙන ලංසුවේ කොන්දේසි කඩ කර ඇති බවට ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ප්‍රකාශයක් සහිතව යොමු කරනු ලබන ඔබගේ ප්‍රථම ලිඛිත එන්තරවාසිය අප වෙත ලැබුණ විගස ............................................. ..................................................................(..................................................................) කට
(මුදල අකුරෙන්) (මුදල ඉලක්කමෙන්)

(අ) නිශ්චිත ලංසු වලංගු කාලය තුළ ලංසුව ඉල්ලා අස්කර ගැනීම:

(ආ) ලංසු කැඳවීමේ ආරාධනාවෙහි අඩංගු (මෙහි මින් මතුවට ලංසුකරුවනට උපදෙස් යනුවෙන් හැඳින්වෙන) ලංසුකරුවන්ට උපදෙස්වලට අනුකූලව වැරදි නිවැරදි කිරීම් නොපිළිගැනීම, හෝ

(ඇ) ලංසු වලංගු කාලය තුළ සේවායයා/ගැනුම්කරු විසින් ලංසුව පිළිගෙන ඇති බවට දැනුම් දෙනු ලැබීමෙන් පසුව:

(i) අවශ්‍ය වේ නම්, කොන්ත්‍රාත්තුව ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම

(ii) ලංසුකරුවනට උපදෙස් අනුකූලව කාර්යය සාධන සුරක්ෂණය සැපයීමට අපොහොසත්වීම ප්‍රතික්ෂේප කිරීමය.

මෙම සුරක්ෂණය (අ) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු වේ නම්, ලංසුකරු විසින් අත්සන් තබන ලද කොන්ත්‍රාත්තුවේ සහ ලංසුකරු විසින් ඔබට නිකුත් කර ඇති කාර්යය සාධන සුරක්ෂණ පත්‍රයේ පිටපත් අප වෙත ලැබීමෙන් පසු හෝ (ආ) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන්නේ නම් (i) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන බවට ලංසුකරුට ඔබ යවන දැන්වීමේ පිටපත ඔබ වෙත ලැබීමෙන් පසු, එනමින් පෙරට යෙදෙන අවස්ථාවේ අවලංගු වනු ඇත. නැතහොත් ................................ දින දක්වා මෙම සුරක්ෂණය බලාත්මකව පවතිනු ඇත. (දිනය සඳහන් කරන්න)

පසු කාලීනව මෙම සුරක්ෂණය යටතේ ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීමක් .............................. දිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලය වෙත ලැබිය යුතුය.

අධිකාරයලත් නියෝජිතයන්ගේ අත්සන/අත්සන්

## 4 කොටස

**4.1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර හා මිරිහාන විදේශගත රැඳවුම් කඳවුරුවල රැඳවියන් සඳහා ආහාර සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම**

මෙහි පහත ''පළමු පාර්ශවය'' යැයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වන (සම්පූර්ණ නම) ........................................................ (ආගමන හා විගමන පාලක ජනරාල් පාඨයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ එම ධූරයට පත්වන අනුප්‍රාප්තිකයෙක් හෝ අනුප්‍රාප්තිකයෝ ද, ආගමන විගමන පාලක ජනරාල් විසින් බලය පැවරූ යම් නිලධාරියෙකු ද, ඒ පාඨයට සියළු දෙනාම ඇතුලත් වන්නාහ) යන අය එක් පක්ෂයකට ද,

මෙහි ''දෙවන පාර්ශවය'' යැයි කියනු ලබන

**(අ) පෞද්ගලික ව්‍යාපාරිකයින් සඳහා**

මතු කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන (පෞද්ගලික ලිපිනය) ......................................................... ...................................................................................................................................
ලිපිනයේ පදිංචි ......................................................................................... (ආයතනයේ ලිපිනය) ස්ථානයේ තම ව්‍යාපාරික කාර්යාලය පවත්වාගෙන යනු ලබන, ......................................................... (කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම) (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් එකී කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම ද, ඔහුගේ උරුමක්කාර, පොල්ම:කාර, අද්මිනිස්ත්‍රාසිකාරයන් ද, හවුල් අයිතිකාරයන් ද, අදහස් කෙරෙන අතර, එම පාඨයට ඒ සියළු දෙනාම ඇතුලත් වන්නාහ.)

**(ආ) සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා**

මින් මතු කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව අංක ......................................... යටතේ ලියාපදිංචි කරන ලද ................................................ ................................................................. (ආයතනයේ ලිපිනය) වූ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන (ආයතනයේ නම) ........................................................................................ (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර පත්වන අධ්‍යක්ෂවරු ද අදහස් කෙරෙන අතර, ඒ පාඨයට ඒ සියළු දෙනාම ඇතුලත් වන්නාහ)

යන අය අනෙක් පාර්ශවයට ද බැඳී එකී දෙපාර්ශවය අතරේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී වර්ෂ 2025 ක් වූ ........................මස ..........වන දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

ඉහත කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන ............................................................................. (කොන්ත්‍රාත්කරුගේ නම හෝ ආයතනයේ නම) පළමු පාර්ශවය යැයි කියනු ලබන "සුහුරුපාය", සුභූතිපුර පාර, බත්තරමුල්ල ලිපිනයෙහි වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා ඒ යටතේ ස්ථාපිත කර ඇති අනෙකුත් ආයතනවල ආහාර සැපයීම සඳහා ඒ වෙනුවෙන් ගිවිස ගත් කාලය තුළ, ලංසු ලේඛනයන්හි සඳහන් මිල ගණන් යටතේ ඉහත කොන්ත්‍රාත්කරු විසින් ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් මෙහි පහත සඳහන් සියළු කොන්දේසිවලට යටත්ව ඉහත කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගැනීමට පළමුවන පාර්ශවය එකඟ වන ලද හෙයින් එම දෙපාර්ශවය පහත සඳහන් පරිදි පොරොන්දු හා ගිවිසුම්වලට එකඟ වන ලදි.

දෙවන පාර්ශවය විසින් ආහාර සැපයීම අපේක්ෂිත අන්දමින් හා සතුටුදායක මට්ටමකින් පවත්වා ගෙන යාමට යටත්ව එම සේවාව සැපයීම වෙනුවෙන් දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කරන මිල ගණන්වලට අනුව පළමු පාර්ශවය විසින් රු. ................................ ක මුදලක් (බදු රහිතව) දෙවන පාර්ශවය වෙත ගෙවීමට එකඟ වේ.

ඉහත සඳහන් ..........................දින සිට ....................... දින දක්වා වූ කාලය කොන්ත්‍රාත්තුවේ ගිවිසුමේ කාල පරිච්ඡේදය වන අතර, ඒ දින සිට කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය දීර්ඝ නොකරනු ලැබුවහොත් හෝ සාධාරණ නීත්‍යානුකූල හේතු මත අවසන් කරනු ලැබුවහොත් ආගමන විගමන පාලක ජනරාල් හා කොන්ත්‍රාත්කරු අතර, ගිවිසුම අවසන් වූ සේ කටයුතු කිරීමට දෙපාර්ශවය බැඳී සිටි.

**ගිවිසුමේ කොන්දේසි** :

1. ඉහත දෙපාර්ශවය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිරීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් බල පැවැත්වෙන බවට ද,

2. මෙහි සඳහන් කොට ඇත්තා වූ කොන්දේසිවලින් ආවරණය නොවන කරුණක් වේ නම්, එය ආගමන විගමන පාලක ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වන බවට ද,

3. ආහාර සැපයීම පරීක්ෂා කිරීමේ බලය ආගමන විගමන පාලක ජනරාල් සතුවන බව ද, කලින් කලට සේවයේ අවශ්‍යතාවය මත දෙනු ලබන උපදෙස් හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බවද,

4. නරක් වූ හෝ කල් ඉකුත් වූ හෝ ආහාරයට නුසුදුසු ආහාර පාන සැපයිය නොහැකි අතර, එවන් අවස්ථාවකදී එම ආහාර වේල සඳහා ගෙවීමක් සිදු නොකෙරන බවටද. මෙය ප්‍රසම්පාදන කොන්දේසි කඩකිරීමක් සේ සලකා කටයුතු කරනු ලබන බවද,

5. සියළු ආහාර රැඳවියන්ට ලබා දීමට පෙර එහි නියැදියක් මිරිහාන කඳවුරේ රාජකාරියෙහි නියුතු බලයලත් නිලධාරියෙකු මගින් පරීක්ෂා කරගත යුතු බවටද,

6. ආහාර සැපයීම හා ඒ සම්බන්ධ තත්ත්වයන් දිගින් දිගටම අසතුටුදායක වේ නම් අදාල කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ආගමන විගමන පාලක ජනරාල්ට බලය ඇති බව ද, එසේම එයට යටත්වීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බවද,

7. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු විසින් ආගමන විගමන පාලක ජනරාල් නමින් රු. .................... වටිනාකමින් යුත් කාර්යය සාධන ඇපකරයක් මහ බැංකුව අනුමත ආයතනයකින් ලබාගෙන ඉදිරිපත් කළ යුතු අතර තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටු කිරීම අසතුටුදායක බව ආගමන විගමන පාලක ජනරාල්ට පෙනී ගියහොත් හෝ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හො කොන්දේසියක් කඩ කර ඇති බව පෙනී ගියහොත් කාර්ය සාධන බැදුම්කරයේ හිමිකම රාජසන්තක කිරීමට ද, තව ද කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ද ආගමන විගමන පාලක ජනරාල්ට බලය ඇති බව සහ කොන්ත්‍රාත්කරු එයට යටත් වන බව ද, එයට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බව ද,

8. එසේම ආහාර සැපයීමේ දී කොන්ත්‍රාත්කරුගේ කාර්ය මණ්ඩලය එම සේවාව නිසිලෙස ඉටු කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමට අවශ්‍ය යැයි අදහස් කරන ඕනෑම අවස්ථාවක දී ආගමන හා විගමන පාලක ජනරාල් හෝ ඔහුගේ/ඇයගේ බලය පැවරූ නිලධාරියා විසින් අධික්ෂණය කරනු ලබන බවද,

9. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වන බව ද,

10. ආහාර සැපයීමට අපොහොසත් වීම මත විවෘත වෙළඳපලෙන් මිලදී ගැනීමට සිදුවන ආහාර වේල් සඳහා වැය වන මුදල සහ 5% ක ගාස්තුව ලංසුකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබුවහොත් ඒ මුදල් ගෙවීමට සේවා සැපයුම්කරු බැඳී සිටින බව ද,

11. කොන්ත්‍රාත්කරු විසින් ඇප වශයෙන් තැන්පත් කරනු ලබන මුදල්වලට කිසිදු පොළියක් ගෙවනු නොලබන බව ද,

12. එසේ ම මෙම කොන්ත්‍රාත්තුව යටතේ තමාගෙන් ඉටුවිය යුතු සේවය ඉෂ්ඨ කිරීමට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරුට මොනයම් හේතුවක් නිසා හෝ අපොහොසත් වුවහොත් වෙනත් ආයතනයකින් එම සේවාව ඉටු කර ගැනීමට විධිවිධාන යෙදීමට ද, එසේ විධි විධාන යෙදීමෙන් ආණ්ඩුවට දරන්නට සිදු වූ යම් අතිරේක වියදමක් වේ නම් ඒ වියදම ද ආහාර සැපයීමේ ආයතනයෙන් අයකර ගැනීමට ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇති බව සහ එම මුදල ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බව ද,

13. එසේම ආහාර සැපයීමේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක මාසයක දැනුම් දීමකින් සේවය නතර කිරීමට හා නැවත ලංසු කැඳවීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇති බව ද, ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් තම සේවය ඉල්ලා අස්කර ගන්නේ නම්, මාස තුනක කාලයකට ප්‍රථම ඒ බව ආගමන හා විගමන පාලක ජනරාල්ට දැන්වීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බව ද,

14. ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු වෙනත් රෙගුලාසි ආගමන හා විගමන පාලක ජනරාල් විසින් වරින් වර නිකුත් කරනු ලබන බව,

15. ආහාර සැපයීමේ කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස කොන්ත්‍රාත්කරු විසින් ලංසු ලියවිලිවල සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එම දැන්වීම් යොමු කළහොත් ඒවා ඔහුට විධිමත් ලෙස භාරදුන්නා ලෙස සලකනු ලබන බවද, ආහාර සැපයීමේ ආයතනයේ ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම ආගමන හා විගමන පාලක ජනරාල්ට දැන්වීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බවද,

16. ආහාර සැපයීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට ආහාර සැපයීමේ ආයතනය විසින් ඒ බැව් ලිඛිතව හෝ වාචිකව ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැන්විය යුතු බව ද,

17. ආහාර සැපයීමේ සේවා කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද සාමාන්‍ය කොන්දේසි පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු, මෙම ගිවිසුමේ අවශ්‍යතාවය සඳහා ලංසු කොන්දේසියක් ලෙස සලකනු ලබන බව ද,

18. කෙසේ වෙතත් එකී සාමාන්‍ය කොන්දේසි පත්‍රිකාවේ සඳහන් යම් වගන්තියක් මෙම ගිවිසුමේ අනෙකුත් යම් වගන්ති හෝ වගන්තියක් සමඟ ගැටෙන්නේ නම්, අදාල වන්නේ කුමක් ද යන්න තීරණය කිරීමේ බලය ආගමන හා විගමන පාලක ජනරාල් සතු වන බවද,

19. මෙහි සඳහන් සියළුම වගන්තිවලින් ප්‍රකාශ වන කරුණු හා අදහස්වලට අනුකූලව කටයුතු කිරීමට එකඟව බැඳී සිටින බව ද,

20. මෙහි දෙවන පාර්ශවය යැයි කියනු ලබන කොන්ත්‍රාත්කරු මෙම ලංසුව ප්‍රදානය කිරීමෙන් පසු වෙනත් කෙනෙකුට පැවරීම හෝ අතුරු බදුදීම සපුරා තහනම් බව ද,

21. මෙම ලංසුවට අදාල ගෙවීම් කරනු ලබන්නේ පවරා ඇති වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර තිබෙන බවට අදාල නිලධාරින් සහතික කිරීමෙන් පසුව හා ලංසුකරු ගෙවීම් ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුව බව ද,

22. ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ඉල්ලා සිටිය හොත් ආහාර සැපයීමේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතික හෝ පොලිස් නිෂ්කාශන සහතික ඉදිරිපත් කිරීමට කොන්ත්‍රාත්කරු සූදානමින් සිටිය යුතු බව ද,

23. සෑම මසකම 15 වන දිනට පෙර (පෙර මාසයේ) මාසික බිල්පත්, ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින අතර, මෙකී දිනට පසුව ඉදිරිපත් කරනු ලබන බිල්පත් සම්බන්ධයෙන් ගෙවීම් ප්‍රමාද වීම මඟින් අලාභයක් වේ නම් එය දරා ගැනීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින බව ද,

24. තව ද, ලංසු ඉදිරිපත් කරනු ලබන්නේ පෞද්ගලික සමාගමක් නම්, එම සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන් / කොටස් හිමිකරුවන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කොන්ත්‍රාත්කරු විසින් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැනුම්දිය යුතු අතර අදාල කොන්දේසිවලට අනුකූලව සේවා සැපයීමට එකඟ වන බව ද,

25. තව ද, ලංසු ලියවිලිවල සඳහන් කාල පරිච්ඡේදයන් තුළ එම සේවාවන් අඛණ්ඩව හා නොඅඩුව සම්පූර්ණ කිරීමට එකඟ වන බව ද ඒ සඳහා බැඳී සිටින බව ද, මෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව එම කාර්යයන් සපුරාලන බවට ද,

26. ඉහත කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් සියළු උපදෙස් හා කොන්දේසි කියවා තේරුම්ගෙන එම කොන්දේසි පරිපූර්ණව හා නොඅඩුව ඉටු කරන බවට එකඟව හා බැඳි දෙපාර්ශවය එයට ......................... දින දී ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී අත්සන් තබන ලදි.

ආයතනයේ අයිතිකරු / අයිතිකරුවන් වෙනුවෙන්

සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව)

සාක්ෂි

1. .............................................
2. .............................................

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන්
ආගමන විගමන පාලක ජනරාල් (නිල මුද්‍රාව)

සාක්ෂි

1. .....................................................
2. .....................................................

**4.2.** කාර්ය සාධන සුරක්ෂණය සඳහා පිළිගත් ආකෘතිය

**Performance Security**

*[Note: the purchaser is required to fill the information marked as"*" and delete this note prior to selling of the bidding document]*

*[The issuing agency, as requested by the successful Bidder, shall fill in this form in accordance with the instructions indicated]*

--------------- *[Issuing Agency's Name, and Address of Issuing Branch or Office]* -------------

***Beneficiary:** *Department of Immigration & Emigration*

Date**: ------------------------**

**PERFORMANCE GUARANTEE No.:------------------------**

We have been informed that ---------------------------------------------------------------------------- *[Name of Supplier]* (hereinafter called "the Supplier") has entered into Contract No. ------------ *[Reference number of the contract]* dated -------------with you, for the ------------supply of -------------*[name of contract and brief description]* (hereinafter called "the Contract").

Furthermore, we understand that, according to the conditions of the Contract, a performance guarantee is required.

At the request of the Supplier, we ------------------------ *[name of Agency]* hereby irrevocably undertake to pay you any sum or sums not exceeding in total an amount of -------------------------------

*[amount in figures]*(------------------------) *[amount in words]*, such sum being payable in the types and proportions of currencies in which the Contract Price is payable, upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the Contractor is in breach of its obligation(s) under the Contract, without your needing to prove or to show grounds for your demand or the sum specified therein.

This guarantee shall expire, no later than the----------day of ----------20---------- *[insert date, 28 days beyond the scheduled completion date including the warranty period]* and any demand for payment under it must be received by us at this office on or before that date.

---------------------------------
[Signature(s)]

4.3 දිවුරුම් ප්‍රකාශය

## Non-collusion Affidavit

(Procurement Guideline Reference - 1.5)

The undersigned bidder or agent, hereby solemnly, sincerely, and truly declares and affirms/makes an oath and states as follows

a) That he/she has not, nor has any other member, representative, or agent of the firm, company, corporation, or partnership representing him/her, entered into any combination, collusion, or similar agreement with any person in connection with the price to be bid
b) That he/she or anyone representing him/her has not taken any step whatsoever to prevent any person from bidding, nor to induce anyone to refrain from bidding; and
c) That this bid is made without reference to any other bid and without any agreement, understanding, or combination with any other person in reference to this bid.

He/she further states that no person, firm, or corporation has received or will receive, directly or indirectly, any rebate, fee, gift, commission, or thing of value in connection with the submission of this bid.

The bidder accepts full responsibility for ensuring the absence of collusion and hereby pledges to abide by fair and ethical competition practices throughout the procurement process and fully comply with the applicable Procurement Guidelines.

I hereby affirm, under the penalties for perjury, that all statements made by me in this affidavit are true and correct.

The foregoing Affidavit having been duly read over and explained by me to the Affirmant above named and he/she having understood the contents therein and admitted to be correct, affirmed and set his/her signature hereto before me) on this ……... day of …………..… at …………………

BEFORE ME,
JUSTICE OF THE PEACE/COMMISSIONER OF OATHS